# සමාජ ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය

බෝලියද්දේ ධම්මකුසල හිමි

නව සහස්‍රයක් කරා එළඹ සිටින විශ්ව සමාජය ඉතා සංකීර්ණය. විද්‍යාත්මක හා තාක්ෂණික වර්ධනයත් සමඟ මිනිසාගේ භෞතික ජීවිතය වඩාත් පහසු කර ඇත. නවීන යන්ත්‍ර සූත්‍ර හා පරිගණක ආශ්‍රිත නිමැවුම් ඉහළ යාමත් සමඟ ම මිනිසාගේ අවශ්‍යතා වඩාත් පහසුවෙන් සපයා ගැනීමට හැකිව තිබේ. සමාජ, ආර්ථික, දේශපාලනික හා පාරිසරික ආදී සෑම ක්ෂේත්‍රයක් ම නවීකරණය වී ඇත. භෞතික වශයෙන් මිනිස් දිවිය කොතරම් පහසු වුවත් සංවර්ධිත රටවල විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුව සංවර්ධිත සමාජ තුළ පමණක් නොව සංවර්ධනය වෙමින් පවතින සමාජ තුළ අර්බුධ රාශියක් නිර්මාණයවීමට හේතු වී තිබේ. විසි එක්වැනි සියවසසේ පොදුවේ ලෝකයට ම සමාජ ගැටලු රාශියකට මුහුණ දීමට සිදුව තිබේ. මේ ගැටලු අතර දරිද්‍රතාවය, සදාචාර විනාශය, සියදිවි නසා ගැනීම, බාල අපචාර, ත්‍රස්තවාදය, අපරාධ වර්ධනය, මත්ද්‍රව්‍ය භාවිතය, අධික ජනගහන වර්ධනය, විරැකියාව හා යුද්ධය යනාදී ගැටලු ප්‍රධාන වේ. දිනෙන් දින සමාජ ගැටලු වර්ධනය වීමට බලපාන වත්මන් සමාජයේ විද්‍යමාන ප්‍රධාන ප්‍රවාහයන් ලෙස මහාපරිමාණයේ පරිභෝජනය, තිමක් නොදකින සංවර්ධන ක්‍රියාදාමය හා ඔනෑම යුද තත්ත්වයකට මුහුණ දීම සඳහා සූදානම් වීම හඳුනාගත හැකි ය.

බුදුන්වහන්සේ පහළ වූ එකල භාරතීය සමාජය ද ගැටලුවලින් තොර පරිපූර්ණ සමාජයක් නොවුණි. භාරතීය සමාජයේ පැවති ගැටලු විග්‍රහයට ලක් කරමින්, සමාජ ගැටලු විසදා ගැනීම සඳහා බුදුන්වහන්සේ දේශනා කළ සමාජ ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය සර්වකාලීන අගයකින් යුක්ත ය. එබැවින් වත්මන් සමාජ ගැටලු විසදාගැනීමට ද එමඟින් මනා පිටුබලයක් ලබා දෙයි. තරඟකාරී ආර්ථික රටාව හා බල අරගලය හෙවත් යුද්ධය පිළිබඳ අවධානය යොමු කරමින් සමාජ ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය අධ්‍යයනයට ලක් කිරීම මෙම ලිපියේ මූලික අරමුණ වෙයි.

විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවත් සමඟ භෞතික දියුණුවක් විද්‍යමාන වුවත් අධ්‍යාත්මික වශයෙන් පුද්ගලයන්ගේ පරිහීම හේතුකොට ගෙන සමාජ ගැටලු දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. මහා පරිමාන සංවර්ධන ක්‍රියාදාමයන් තුළින් පමණක් සංවර්ධන



ඉලක්කයන් සපුරා ගැනිමට මිනිසා උත්සහ කරමින් සිටියි. අධ්‍යාත්මික සංවර්ධයෙන් තොර හුදු ආර්ථික සංවර්ධනය පමණක් නියම සංවර්ධනය දැයි, දිනෙන් දින වර්ධනය වන සමාජ ගැටලුත් සමඟ නැවත සිතිය යුතු කාලය එළඹ ඇත. සමාජය ගැටලුවලින් පිරි සංකීර්ණ තැනක් බවට පත්ව ඇත්තේ අධ්‍යාත්මය පිරිහුණු පුහුදුන් මිනිසුන්ගේ ම ක්‍රියා කලාපයන් නිසාවෙනි. බුදු දහමට අනුව සමාජය යනු අවුල් වියවුල්වලින් හා ගැටලුවලින් පිරි සංකීර්ණ තැනකි.

"අන්තො ජටා බහි ජටා - ජටාය ජටිතා පජා
තං තං ගොතම පුඡ්චාම - කො ඉමං විජටයේ වටං"[1]

"ඇතුළත අවුල්ය පිටත අවුල්ය ප්‍රජාව අවුලෙන් වළදනා ලද්දීය. ගෞතමයන් වහන්ස එසේ හෙයින් විචාරමි, කවරක් මේ අවුල නිරවුල් කරන්නේ දැයි?

අවුල් වියවුල්වලින් පිරි සමාජයේ ගැටුලු නිරාකරණය කර ගනිමින් යහපත්ව ජීවත් වීමට බුදුදහම මග පෙන්වයි. හේතු ඵල සම්බන්ධයට මුල්තැන දෙනමින් සමාජ ගැටලු නිරාකරණය කර ගැනීමේ දී ගැටලුවේ හේතුව සොයා පිළියම් යෙදීමෙන් විසදා ගැනීමට පුද්ගලයා මෙහෙයවයි. නූතන සමාජ විද්‍යාඥයින් සමාජ ගැටලු කුමන ආකාරයකට විග්‍රහ කළත් බුදු දහමට අනුව ගැටලු නිර්මාණය වීමේ අවසාන විග්‍රහය වන්නේ පුද්ගලයන් සම්මා ආජීවය නොසලකා හැරීමයි.

වර්තමාන සමාජය දෙස සමාජ විද්‍යාත්මකව සුපරික්ෂාකාරීව බලන විට පැහදිළි වන්නේ සමාජීය පුද්ගලයාට නොයෙකුත් පීඩනයන්ට මැදිව ජීවත් වීමට සිදු වී ඇති බවයි. ආර්ථික, සාමාජික, දේශපාලනික හා පෞද්ගලික ආදී සමාජ ගැටළුවලින් පුද්ගල ජීවිතය හා සමාජය සංකීර්ණ වීම මෙයට ප්‍රධාන ම සාධකය ලෙස හඳුනාගත හැකි ය. දේශපාලනික වශයෙන් ගත් විට දේශපාලන නායකයන් ඡන්ද, ද්වේෂ, භය හා මෝහ යන සතර අගතියෙන් අගතියට යාම සමාජ ගැටලු නිර්මාණයට හේතු වෙයි. පුද්ගලයා අධික තෘෂ්ණාව පදනම් කරගෙන ධනය පසුපස හඹා යාම හා ධනය උපයා ගැනීම එකම අරමුණ කර ගෙන ප්‍රාණඝාතය, සොරකම ආදී සමාජ විරෝධී ක්‍රියාවල නිරත වීමෙන් සමාජය තුළ ව්‍යාප්තව ඇති සමාජ ගැටලු රාශියකින් මිනිසා පීඩා විදියි. සමාජ විද්‍යාත්මකව විග්‍රහ කර බලන විට සමාජ



OCT 2015

ගැටලුවලට ප්‍රධාන සාධකය වන්නේ බල ලෝභය හා අසාර්ථක අර්ථක්‍රමය යි. වර්තමානයේ ලොව පවතින්නා වූ තරඟකාරී ආර්ථික රටාව හා බල අරගලය හෙවත් යුද පසුබිම තුළ ප්‍රධානත්වය මනුෂ්‍යත්වයට නොව ධනයට හා බලයට හිමිව ඇත. ධනයෙන් පොහොසත් වීම සංවර්ධනයේ ප්‍රධාන මිනුම්දණ්ඩ බවට පත්ව තිබීම අපරාධ වර්ධනයට ප්‍රබල ලෙස බලපා තිබේ.

ලොව ක්‍රියාත්මකව පවතින ප්‍රධාන අර්ථක්‍රම දෙක මීට වසර දෙසීයකට පමණ පෙර කාල්මාක්ස් සහ ඇඩම් ස්මිත් යන දෙදෙනාගේ සංකල්ප මත ගොඩනැගුනකි. ඇඩම් ස්මිත් ජාතීන්ගේ ධනය ග්‍රන්ථය රචනා කරමින් නිදහස් වෙළඳාම පිළිබඳ අදහස මුල් කරගෙන නිදහස් වෙළඳ පොළ අර්ථක්‍රමයත් කාල් මාක්ස් ඉදිරිපත් කළ විද්‍යාත්මක භෞතික වාදය නම් වූ විප්ලවීය සමාජ දර්ශනය තුළ මධ්‍ය සැලසුම් ගත ආර්ථක්‍රමයත් යනුවෙන් ලොව නව අර්තක්‍රම දෙකක් බිහිවිය.[2] ලොව ක්‍රියාත්මක වන මෙම අර්ථක්‍රමයන් සමාජය තුළ තර්ගකාරීත්වයක් නිර්මාණය කිරීමටත් ඒ තුළ සමාජ ගැටලු රාශියක් නිර්මාණය වීමටත් හේතු වී ඇත. භෞතික සංවර්ධනය පමණක් අරමුණු කරගත් මෙම ආර්ථික දර්ශනයෙන් භෞතික හා ආධ්‍යාත්මික සංවර්ධනය පදනම් කරගත් ආර්ථික දර්ශනයක් ඉදිරිපත් කරන බෞද්ධ අර්ථ ක්‍රමයට පටහැනි වෙයි. භෞතිකවාදී දර්ශනය තුළ පිහිටි වත්මන් අර්ථක්‍රමය ප්‍රධාන තැන සාරධර්ම ගුණධර්මවලට නොව භෞතික සම්පත්වලට පමණක් සීමා වී ඇත. සෑම දේකටම වඩා සමාජ අගයන් තීරණය කරනු ලබන්නේ ධනය මතයි.

දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ දී බුදුන්වහන්සේ අසාර්ථක අර්ථක්‍රමය නිසා දිළිඳුකමත් දිළඳුකම නිසා නොයෙක් අපරාධයන්ට යොමුවන අයුරුත් විග්‍රහ කරන අතර ඒත් සමඟ ම සමාජ ගැටලු රාශියක් නිර්මාණය වන බව පැහැදිලි කළ හ.

ඉති බො භික්ඛවේ අධනානං ධනේ අනුප්පාදීය මානෙ දාළිද්දියං වේපුල්ලමගමාසි දාළද්දියං වේපුල්ලං ගතෙ අදින්නාදානං වේපුල්ලමගමාසි අදින්නාදානං වෙපුල්ලං ගතෙ සත්ථං වෙපුල්ල මගමාසි සත්තෙ වෙපුල්ලං ගතෙ පාණාතිපාතො වෙපුල්ලමගමාසි පාණාතිපාතෙ වෙපුල්ලං ගතෙ මුසාවාදො වෙපුල්ලමගමාසි මුසාවාදෙ වෙපුල්ලං ගතෙ පිසුණාවාචා වෙපුල්ලමගමාසි පිසුණාවාචාය වෙපුල්ලං ගතාය කාමෙසු මිච්චාචාරෙ වෙපුල්ලමගමාසි........................[3]



(මහණෙනි මෙසේ දිළින්දන්ට ධනය නොදෙන කල්හි දිළිඳු බව වැඩීමට ගියේ ය. දිළිඳු බව වැඩීමට ගිය කල්හි අදත්තාදානය වැඩීමට ගියේ ය. අදත්තාදානය වැඩීමට ගිය කල්හි ආයුධ වැඩීමට ගියේ ය. ආයුධ වැඩීමට ගිය කල්හි ප්‍රාණඝාතය වැඩීමට ගියේ ය. ප්‍රාණඝාතය වැඩීමට ගිල කල්හි මුසාවාදය වැඩීමට ගියේ ය. මුසාවාදය වැඩීමට ගිය කල්හි පිසුණා වාචාව (කේලාම් කීම) වැඩීමට ගියේ ය. පිසුණා වාචා වැඩීමට ගිය කල්හි කාමමිථ්‍යාචාරය වැඩීමට ගියේ ය. ........................)

ආදී වශයෙන් ආර්ථික වශයෙන් පුද්ගලයා පිරිහීම තුළ පුද්ගලයන් ක්‍රමයෙන් අයහපත් දිවිපැවැත්මකට යොමුවන ආකාරය විග්‍රහ කරයි. බුදුන් වහන්සේ දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ ද දිළිඳුකම, සොරකම, ප්‍රාණඝාතය, බොරුකීම, කේලාම් කීම, කාමය වරදවා හැසිරීම ආදී සමාජ ගැටළු රැසක් වර්ධනය වීමට දුර්වල ආර්ථික පසුබිම හේතු සාධක වන බව දේශනා කළහ.[4] දුර්වල ආර්ථිකය දිළිඳුකම ඇති කරයි. කාමභෝගී ගිහියාට දිළිඳුකම දුකක් බව අංගුත්තර නිකායේ ඉණ සූත්‍රයෙන් පැහැදිලි වේ.

''දාළිද්‍රං භික්ඛවේ දුක්කං ලෝකස්මි ගිහිනා කාම භෝගිනා''[5]

සියලුදෙනාම ධනවතුන් කළ නොහැකි වුවත් නූතන ශිෂ්ටාචාරයේ නිමක් නොදකින මහාපරිමාණ භෞතික සංවර්ධන ක්‍රියාදාමයත් මහාපරිමාණයේ පරිභෝජනයත් මනුෂ්‍ය අවශ්‍යතා බහුල වීමත් නිසා මිනිසුන් බොහෝ දෙනෙක් දිළින්දන් බවට පත් කර ඇත. සැපවත් ජීවිතයක් යනු මූලික පහසුකම් සහිතව පැවැත්මක් ලෙස ගන්නේනම් සම්පත් දිනා ගැනීම සඳහා නූතන සමාජයේ පවතින වේගවත් බව අඩු වනු ඇත. නමුත් පවතින සීමිත සම්පත් තුළින් අසීමිත මිනිස් ආශාවන් සන්තර්පණය කිරීමට නොහැක වීම සමාජ ගැටලු වර්ධනය වීමට හේතු වී ඇත. පුද්ගලයා තුළ පවතින අශාව අසීමිත ය.

''ඌනො ලෝකෝ අතිත්තො තණ්හා දසො''[6]

''න කහාපණ වස්සෙන - තිත්ති කාමේසු විජ්ජති''[7]

ස්වභාවිකවම පුද්ගලයා අසීමිත අශාවන්ගෙන් පෙළෙන බවත් ඒවා සන්තර්පණය කිරීම ඉතා අපහසු බවත් බුදුන් වහන්සේ දේශනා කළහ. එබැවින් නූතන ආර්ථික දර්ශයේ එන ඉල්ලුමට සැපයීම යන න්‍යායට බුදු දහම එකඟ නොවෙයි. බෞද්ධ ආර්ථික දර්ශනය තුළ පුද්ගලයාගේ අසීමිත ආශාවන් පාලනය කර ගැනීමට බුදු දහම මඟ පෙන්වයි.

ලෝකයේ ක්‍රියාත්මක වන භෞතිකවාදී ආර්ථික දර්ශනයෙන් සමාජ ප්‍රශ්නවලට මුළුමනින්ම විසඳුම් නොලැබෙයි. එමඟින් අතෘප්තිය හා දිළඳුකම සමාජයේ නිර්මාණය කර තිබේ. ගෘහ ජීවිතයේ දී දිළඳු බව හෙවත් දුර්වල ආර්ථිකය නිසා ණය ගැනීමට සිදුවන බවත් ණය නිසා පොලී බරත් චෝදනාත් ණය හමියන් ලුහුබැඳීමත් වධ බන්ධනයට ලක් වීමත් සිදුවන බව ඉණ සූත්‍රයේ සඳහන්වේ.[8] අසීමිත මිනිස් ආශාවන් සීමා කරගනිමින් පරිපූර්ණ ජීවිතයක් ගොඩනගා ගැනීමට නම් බෞද්ධ ආර්ථික දර්ශනය මඟ පෙන්වයි.

බෞද්ධ ආර්ථික ක්‍රමයේ දී ධර්මය මූලික කර ගනිමින් ධනය ඉපයීමත් පරිභෝජනය කිරීමත් අවධාරණය කරයි.

1. නිෂ්පාදනය හෙවත් රැස්කිරීම (ධම්මේන භොගෙ පරියෙසති)
2. පරිභෝජනය (අත්තානං සුඛෙති පීණෙති)
3. බෙදාහැරීම (සංවිභජති පුඤ්ඤානි කරොති)
4. පරිභෝජන දර්ශනය (අගතිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවං දස්සාවි නිස්සරණ පඤ්ඤො පරිභුඤ්ජති [9]

බුදුන්වහන්සේ කෙසේ හෝ ධනය ඉපයීම අනුමත නොකරයි. ආර්ථිකය යනු යහපත් සමාජයක පදනමයි. අසාර්ථක මෙන් ම අසමතුලිත ආර්ථික ක්‍රමයක් ක්‍රියාත්මක වන සමාජයක එයම සමාජ ගැටලු රාශියක ආරම්භය බව බුදුන්වහන්සේ දේශනා කළහ. මේ නිසා ධනය ඉපයීම යහපත් විය යුතුය. සම්මා ආජීවයේ දී විස්තර කෙරෙන පරිදි පුද්ගලයාටත් සමාජයටත් හානියක් නොවන ධාර්මික ජීවනෝපායන් තෝරාගත යුතුය. යහපත් ජීවන වෘත්තියක් තෝරා ගැනීම සඳහා සීල සම්පදා අත්‍යාවශ්‍ය වෙයි. අසහාසිකව දැහැමින් ධනය උපයා ගත යුතු බව අණන සූත්‍රයේ දී බුදුන්වහන්සේ දේශනා කළහ.

"ඉධ ගහපති කුලපුත්තස්ස භෝගා හොන්ති උට්ඨානවිරියාධිගතා බහාබලපරිචිතා සෙදාවක්ඛිත්තා ධම්මිකා ධම්ම ලද්ධා"[10]

ධනඤ්ජානි සූත්‍රයේ දී අධාර්මිකව ධනය ඉපයීම නිසා සිදුවන හානිය විස්තරාත්මකව දේශනා කරන බුදුන්වහන්සේ ධනය ඉපයීමේ දී පුද්ගලයා සම්මා ආජීවය සහ සම්මා කම්මන්තය මත පිහිටා කටයුතු කළ යුතු බව අවධාරණය කළහ. සත්ව වෙළඳාම, ආයුධ වෙළඳාම, වස විෂ වෙළඳාම, මත ද්‍රව්‍ය වෙළඳාම හා වහල් වෙළඳාම නොකළ යුතු



අධාර්මික කර්මාන්ත ලෙස බුදුන්වහන්සේ දේශනා කළහ. ධනය ඉපයීමේ දී සම්මා කම්මන්තයට පුද්ගලයා යොමු කිරිම තුළ සමාජ ගැටලු රාශියකට විසඳුම් ඉදිරිපත් කරයි. බුදුන්වහන්සේ ධාර්මිකව ධනය ඉපයිය යුතු බව දේශනා කරන අතරම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී ගොවිතැන, වෙළඳාම, සත්ව පාලනය, ආරක්ෂක සේවය හා රාජ්‍ය සේවය ආදී වශයෙන් පුද්ගලයාට ධනය ඉපයිය යුතු ධාර්මික ක්‍රම හයක් ඉදිරිපත් කරයි.[11] බුදුදහම අනුමත කරන මේ ධාර්මික ක්‍රම මගින් දරිද්‍රතාවයට මූලික වශයෙන් විසඳුම් ලැබෙන අතර ප්‍රාණඝාතය, සොරකම හා මත්ද්‍රව්‍ය භාවිතය ආදී වත්මන් සමාජය මුහුණ දී ඇති සංකීර්ණ ගැටලු රාශියකට පරිපූර්ණ විසඳුම් ඉදිරිපත් කරයි.

බුදුන්වහන්සේ චක්කවත්ති සීහනාද සූත්‍රයෙහි දේශනා කරන ආකාරයට සැලැස්මකින් තොර ධන පරිත්‍යාගය මිනිසුන් තව තවත් සොරකමට යොමු කරෙයි[12] දඬුවමින් මිනිසා වැරදි අත හැරීම වෙනුවට අවි ආයුධ ගෙන අපරාධ කිරීමට යොමු වේ. ධනය ධාර්මිකව උපයා ගත යුතු බව බුදුන්වහන්සේ දේශනා කරන අතර ම ධාර්මිකව උපයා ගත් ධනය පරිභොජනය කළ යුතු ආකාරය සිගාලෝවාද සූත්‍රයේ දේශනා කළහ.

"එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය
ද්වීහි කම්මං පයෝජයේ
චතුත්ථඤ් ච නිධාපෙය්‍ය
ආපදාසු භවිස්සති"[13]

(භෝගයන්ගෙන් එක් කොටසක් පරිභෝජනය සඳහාය. කොටස් දෙකක් (කෘෂි වණික් කර්මාදී) කර්මාන්තයන්හි යොදන්නේ ය. විපතක් පැමිණි කල්හි ප්‍රයෝජන පිණිස වන්නේ යැයි සලකා සතර වන කොටස නිදන් කොට තබන්නේ ය. )

බුදුන්වහන්සේ සිගාල ගෘහපතියාට උපයාගත් ධනය අය වැය පරතරය හඳුනාගෙන පරිහරණය කළයුතු ආකාරය දේශනා කළහ. උපයාගත් ධනය කොටස් හතරකට බෙදා එක් කොටසක් පරිභෝජනයටත් කොටස් දෙකක් ආයෝජනයටත් සතරවන කොටස ආපදාවක දී ගැනීමටත් යොදා ගත යුතු බව පැහැදිලි කරයි. ධනය ඉපයීම පරිභෝජනය ආරක්ෂණය යන සියලුම අංශ කෙරෙහි බෞද්ධ ආර්ථික ක්‍රමය අවධානය යොමු කරයි. විශේෂයෙන් ධන පරිභෝජනයේ දී ධාර්මිකව අසහාසිකව ධනය උපයාගෙන (ආදීනවම්

දස්සාවි පරිභුඤ්ජති) ආදීනව දකිමින් පරිභෝජනය කළ යුතුය. මෙ අනුව සමජීවිකතා යන්න ධන පරිභෝජනය කිරීමේ දී අනුගමනය කළ යුතු බෞද්ධ පිළිවෙත බව බුදුන් වහන්සේ දේශනා කළහ. බෞද්ධ අර්ථක්‍රමයෙන් පෙන්වා දෙන ධනය උපයන මාර්ග, ධන ආයෝජනය මෙන් ම ධන පරිභෝජනය ද මැනවින් දූන ක්‍රියා කිරීමෙන් අසමතුලිත දුර්වල ආර්ථික තත්වයන් යටතේ පුද්ගලයාට හා සමාජයට පොදුවේ බලපාන ගැටලුවලට විසඳුම් සොයාගත හැකි අතර යහපත් මානව හිතවාදී සමාජ වාතාවරනයක් බෞද්ධ අර්ථ ක්‍රමය මගින් ගොඩනගා ගත හැකිබව පැහැදිලිය.

ආරථිකය සංවර්ධනය මූලිකරගෙන සමාජය තුළ ක්‍රියාත්මක වන නිමක් නොදකින සංවර්ධන ව්‍යාපෘති හා මහාපරිමාණ පරිභෝජන රටාව මෙන් ම බලය අතපත් කර ගැනීම සඳහා කෙරෙන යුද්ධය ද ප්‍රබල සමාජ අර්බුදයක් ලෙස වර්ධනය වන අතර ම තවත් සමාජ ප්‍රශ්න රාශියකට ම මූලබීජය බවට ද පත්ව ඇත. වර්තමානයේ යුද්ධය කොතරම් බිහිසුණු ද කිව හොත් මුලු විශ්වයම සුළු මොහොතකින් විනාශ කළ හැකි තරමේ අවි ආයුධ මිනිසා නිර්මාණය කර හමාර ය. මෙම විනාශකාරී බව දෙවන ලෝක යුද සමයේ ජපානයේ හිරෝසිමා නාගසාකිවලට හෙළන ලද පරමාණු බෝම්බවලින් සිදු වූ විනාශය කියාපායි. යුද්ධය ප්‍රධාන සමාජ ගැටලුවක් ලෙස හඳුනාගන්නා වූ බුදු දහම යුද්ධයට හේතු සාධක සැකසෙන්නේ කෙසේ දැයි සාකච්ඡා කරයි. පුද්ගලයන් තුළ ඇති අධික තෘෂ්ණාව මුල් කරගෙන සමාජය තුළ ගැටුම නිර්මාණය වන අයුරු මහා නිදන සූත්‍රයේ ඉදිරිපත් කරයි.

"ඉති ඛො පනේතං ආනන්ද වේදනං පටිච්ච තණ්හා, තණ්හා ටටිච්ච පරියේසනා, පරියේසනා පටිච්ච ලාභො, ලාභං පටිච්ච විනිච්ඡයො, විනිච්ඡයං පටිච්ච ඡන්දරාගො, ඡන්දරාගං පටිච්ච අජ්ඣෝසානං, අජ්ඣෝසානං පටිච්ච පරිග්ගහො, පරිග්ගහං පටිච්ච මච්ඡරියං, මච්ඡරියං පටිච්ච ආරක්ඛො, ආරක්ඛාධිකරණං පටිච්ච දණ්ඩාදාන සත්ථාදාන කලහ විග්ගහ විවාදතුවං තුවං පෙසුඤ්ඤමුසාවාදා අනෙක පාපකා අකුසලා ධම්මා සම්භවන්ති"[14]

(ආනන්දය මෙසේ වේදනාව නිසා තෘෂ්ණාව වේ, තෘෂ්ණාව නිසා පර්යේෂණය (අරමුණු සෙවීම) වේ, පර්යේෂණය නිසා ලාභය (අරමුණු ලැබීම) වේ, ලාභය නිසා විතර්කවිනිශ්චය (අරමුණෙහි ඉටු අනිටු බව විතර්කයෙන් නිස්චය කොට ගැනීම) වේ, විනිශ්චය නිසා ඡන්දරාග (විතර්කික වස්තුව කෙරෙහි ඇල්ම) වේ, ඡන්දරාගය නිසා



අධ්‍යාවසානය (මමය මාගේය යැයි බලවත් සනිටුහන) වේ, අධ්‍යවසානය නිසා පරිග්‍රහනය (තෘෂ්ණා දිෂ්ටි විසින් මගේ යැයි අයත් කර ගැන්ම) වේ, පරිග්‍රහනය නිසා මසුරුබව වේ, මසුරුබව නිසා රැක්ම වේ, රැක්ම කරණ කොට ගෙන දඩුමුගුරු දැරීම, කලහ විග්‍රහ (විරෝදය පෑම) විවාද, තුවං තුවං වාද (ඇනුම් බැණුම්) කේලම් මුසා බිණුම් නොයෙක් ලාමක අකුසල් දහම්හු පහළ වෙත්,) යුද්ධයක් ඇති විට සිදුවන භෞතික සම්පත් මෙන් ම මානව සම්පත් විනාශය අති විශාලය. බුදු සමය තුළ හිංසාවාදී ගැටුම් අනුමත නොකරන අතර හිංසාවාදී වූ යුද්ධය ප්‍රතික්ෂේප කරයි. බුදු සමය උගන්වන්නේ සියලු සත්වයන්ට මෛත්‍රි කිරීමයි.

"සුඛිනො වා ඛෙමිනො හොන්තු
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා"[15]

(හැම සත්හු කායික සුවයෙන් සුව ඇති වෙත්වා. භය උපද්‍රව නැති විමෙන් ක්ෂෙම වෙත්වා.මානසික සුවයෙන් සුඛිතසිත් ඇති වෙත්වා.) බුදු සමයේ මෛත්‍රිය විශ්වයට ම පැතිර වීමට පුද්ගලයා මෙහෙයවයි. යුද්ධය තුළින් තවකෙකු පරදා ලබන ජයග්‍රහණය සමාජයේ එකිනෙකා අතර වෛරය පැතිරයාමට හේතු සාධක වන බව බුදුන් වහන්සේ පැහැදිලි කළ හ. .

"ජයං වේරං පසවති
දුක්ඛං සෙති පරාජිතො
උපසන්තො සුඛං සෙති
හිත්වා ජය පරාජයං"[16]

(දින්නේ වෛරී ජනයා ලබයි. පැරදුනේ දුකසේ වෙසෙයි. දිනුම් පැරදුම් දෙක හැර සන්සිඳුනේ සුවසේ වෙසෙයි.) ජයග්‍රහණය වෛරය ඇති කරන්නේ නම් එය තවකෙකු පරාජය කොට ලබන්නකි. පරාජය දුක ඇති කරන්නේ නම් තවකෙකු පරදා ලබන ජය සතුට භුක්ති විදීමට හේතු නොවේ. මේ දෙකෙන්ම තොරව ලබන්නා වූ ජය සංහිඳියාවේ සැපත බැවින් සැමට භුක්ති විදිය හැකි ය. මෙලෙස යුද්ධයේ යථා ස්වරූපය බුදුන්වහන්සේ දේශනා කළා පමණක් නොව යුද්ධය නැවැත් වීමට සක්‍රියව දායක වෙමින් යුද්ධය වලක්වා ගැනීමට නිවැරදි මග ආදර්ශයෙන් පෙන්වා දුන්හ. සාමයෙන් ගැටලු විසඳා ගැනීමේ අගය දේශනාකරමින් ශාක්‍ය කෝලිය යුද්ධය වලක්වාලීමට බුදුන්වහන්සේ ක්‍රියා කළහ.



02 OCT 2015

සුත්ත නිපාතයේ ධම්මික සූත්‍රයේ සඳහන් ආකාරයට සතුන් මැරීම අනුන් ලවා මැරවීම හා එය අනුමත කිරීම ප්‍රාණඝාත අකුසලයට අයත් බව බුදුන් වහන්සේ දේශනා කළහ. මෙම පදනම මත පිහිටා බෞද්ධයන් විසින් ප්‍රාණඝාතය හා හිංසනය දුරින්ම දුරු කළයුතු බව වැටහෙයි. ගිහියාගේ නිත්‍ය ශීලය වූ පංච ශීලය විග්‍රහ කර බලන විටද යුද්ධයකට යාමට ඇති ඉඩ කඩ සපුරා අවුරා ඇති බව පැහැදිලි වෙයි. පංචශීලයේ සෑම ශික්ෂා පදයකම ප්‍රතිෂේධනය හා ප්‍රතිග්‍රහණය වශයෙන් කොටස් දෙකක් පවතී. ප්‍රතිෂේධනය යනු වැලකීමයි. ප්‍රතිග්‍රහණය යනු ක්‍රියාත්මක පැත්තයි. පිළිගැනීම බාරගැනීම එයින් අදහස් වෙයි. බොහෝ විට සිදු වී ඇති දේ නම් ප්‍රතිෂේදනයට වැඩි අවධානයක් යොමු කොට ප්‍රතිග්‍රහණය අමතක කරලීමය. පංච ශීලයේ මුල්ප ශික්ෂා පදය අනුව බලන විට ප්‍රතිෂේධනය නම් සතුන් නොමැරීමය. ප්‍රතිග්‍රහණය යන්න සූත්‍රවල විග්‍රහ කර දක්වන්නේ සතුන් මැරීමට හා හිංසාවට ගත් අවි ආයුධ හා දඩු මුගුරු ඉවත් කිරීම හා සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පීව විසීමයි.

''පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති. නිහිත දණ්ඩො නිහිත සත්ථො ලජ්ජී දයා පන්නො සබ්බපාණභූත හිතානුකම්පී විහරති''[17]

මේ විග්‍රහ තුළ පැහැදිලි වන්නේ යුද්ධය පිටු දැක සාමය ක්‍රියාත්මක කිරීමයි. උපන් ලැජ්ජා බිය පදනම් කොට ගෙන ඇතිවන ආත්ම ශික්ෂණය තුළින් යුද්ධයෙන් වැලකී සමස්ත විශ්වයටම මෛත්‍රී කිරීමට පුද්ගලයා පොලඹවනු ලබයි. අවි ආයුධ අතට ගත් පුද්ගලයාගේ පරමාර්ථය පර පණ නැසීම හෝ අනුන් හිංසාවට කල් කිරීමයි. එවැන්නෙකු තුළ කරුණාව ඇති විය නොහැකිය. තත්කාලීන ආගමික සිරිතක් ලෙස බිලිපූජා පවත්වමින් සිදු කළ යාගය හෝම පවා ප්‍රතික්ෂෙප කිරීමෙන් පැහැදිලි වන්නේ යුද්ධයට ඝාතනයට හා හිංසනයට බුදු දහම තුළ කිසිදු ඉඩක් නොමැති බවයි.

යුද්ධය කිසිවෙකු කවර හෝ පරමාර්ථයකට පමුණුවන්නේ නැත. බුදු දහම තුළ එය දැඩි පිළිකුලට භාජනය කරයි. භික්ෂූන්ට කතාබහ නොකළ යුතු දෙතිස් කතා අතරින් කොටස් තුනක්ම යුද්ධය හා සම්බන්ධ වෙයි. එනම් යුද්ධය පිළිබඳව සේනාව පිළිබඳව හා රණ ශූරයින් පිළිඳව කතා කිරීම භික්ෂුවකට නොවටනා බව බුදුන් වහන්සේ දේශනා කළහ. මෙවැනි කතා හඳුන්වනු ලැබ ඇත්තේ පහත් ලාමක නිවනට අතිශය බාධා කරන කතා ලෙසයි.



බුදු දහම තුළ යුද්ධය පිටු දකින්නේ යුද්ධයෙන් සඳුවන හිංසනය හා ඝාතනය නිසාවෙනි. පර පණ නැසීම බුදු සමය කිසිලෙසකත් අනුමත නොකරන අතර තවකෙකුගේ ජීවිතය තොර කිරීම සම්බන්ධ පුද්ගලයන් වසලයකු ලෙස බුදුන්වහන්සේ දේශනා කළහ.

''ඒකජං වා ද්විජං වාපි
යෝධ පාණාති හිංසති
යස්ස පාණෙ දයා නත්ථි
තං ජඤ්ඤා වසලො ඉති''[18]

''මේ ලෝකයෙහි යමෙක් එක්වරක් උපන්නා වූ හෝ දෙවරක් උපන්නා වූ හෝ ප්‍රාණීන් හිංසා කෙරේ ද දිවි තොර කෙරේ ද යමෙකු හට සත්වයා කෙරෙහි දයාවක් නැත්තේ ද ඔහු වසලයා යයි දත යුතුයි.''මේ අනුව ප්‍රාණඝාතය පිළිබඳව බුදු සමයේ කෙරෙන විග්‍රහයන් අනුව යුද්ධයට කිසිදු ඉඩක් නොලැබෙයි.

අජාසත්ත හා කොසල රජු අතර ඇති වූ යුද්ධයේ දී අජාසත් රජු කොසොල් රජුට පරාජය වීමෙන් පසු ඔහුගේ සේනාව ද කොසොල් රජු තමන් සතුකර ගනියි. අජාසත් රජු ජීවග්‍රහායෙන් අල්ලාගත් පුවතත් ඉන් අජාසත්ත රජු දුක්මුසුව සිටින අයුරුත් ඇසූ බුදුන්වහන්සේ යුද්ධය තුළ ඇති භීතියත් ඊට උන්වහන්සේ තුළ පැවති විරෝධයත් පෙන්වා දුන් අයුරු සංයුත්ත නිකායේ සඳහන් වේ. පුද්ගලයාට යම්තාක් ශක්තිය පවතී ද ඒ තාක් අන්‍යයන් වනසන්නේ ය. යම් කලෙක එම පුද්ගලයාගේ බලය ශක්තිය හීන වේ ද එවිට ඔහු පීඩාවට පත් කළ අය විසින් එම පුද්ගලයා පීඩාවට පත් කරනු ලැබේ. මේ ලෝක ධර්මයෙන් කිසිවෙකුටත් ගැලවිය නොහැකි බව දේශනා කරන බුදුන් වහන්සේ යුද්ධයේ ආදීනව දේශනා කරමින් අනුන් නසන්නා නසන්නට තවකෙනෙක් පිටු පසින් පැමිණෙන බව දේශනා කළහ.

''හන්තා ලබති හන්තාරං
ජේතාරං ලභතෙ ජයං
අක්කොසෙ කො ච අක්කොසං
රොසෙ කාරඤ්ච රොසකො
අථ කම්මවිවට්ටෙන
සො විලුත්තො විලුප්පතී''[19]

"(මෙරමා) නසන්නා (තමා) නසන්නෙකු ලබයි. (මෙරමා) දිනන්නා තමා දිනන්නෙකු ලබයි. ආක්‍රෝශ කරන්නා ආක්‍රෝශ කරන්නෙකු ලබයි. කිපෙන්නා කිපෙන්නෙකු ලබයි. තවද කර්මය බිහි කිරීමෙන් ඒ (මෙරමා) නැසූ පුද්ගල තෙමේ (මෙරමා) විසින් නසනු ලැබේ." මේ පදනම මත ජය පරාජය යැයි තිර යමක් ලොව නැත. ජයග්‍රහණය තුළ ම පරාජයේ බීජ පවතී. පරාජය තුළ ම ජයග්‍රහනයේ බීජ පවතී. මේ දෙ අංශයම දැන ගන්නා කිසිසේත්ම කවර හෝ අරමුණක් ඉටුකර ගැනීපට යුද්ධයකට නොපැටලෙයි. එබඳු යථාර්ථවාදී නුවණින් ක්‍රියා කරන පුද්ගලයා නිරතුරුවම සමාජය රැචි කරයි.

මිනිසුන් අතර අන්‍යෝන්‍ය බැඳීම සහජීවනය විනාශකර සමාජ ගැටලු රාශියකට හේතු වන යුද්ධය බුදු සමය තුළ පිටු දකින්නේ එහි ඇති බිහිසුණු බව නිසාම ය. යුද්ධයේ අනිවාර්ය ප්‍රතිඵලයක්සේ පෙන්වා දී ඇත්තේ ගම් දනව් හා ජනයා සතුන් විනාශ කිරීම පමණක් නොව යුද්ධය නිසා දියුණුවට පත් වූ ගමක් නගරයක් දනව්වක් නොමැත බව ය. යුද්ධය ප්‍රතික්ෂේප කරන බුදුදහම පුද්ගලයන් අතර ඇතිවන ගැටලු සමගියෙන් විසදා ගැනීමට මඟ පෙන්වයි.

"නහි වෙරෙන වේරානි
සම්මන්තී ද කුදාචනං
අවේරෙනච සම්මන්ති
එස ධම්මො සනන්තනො"[20]

වෛරය දුරු කළ යුත්තේ වෛරයෙන් නොව අවෛරයෙන් බව බුදු දහම පෙන්වා දෙයි. එමනිසා යුදමය ගැටලු විසදා ගැනීමට බුදු දහම අවෛරී මාවත යෝජනා කරයි. අවිහිංසාවාදී සමාජ දර්ශනයක් වූ බුදු සමය යුදධය වැනි හිංසනයට බර වූ ක්‍රියාවලියකට අනුබල නොදෙයි. සමගියෙන් රුස්ව සමගියෙන් සාකච්ඡාකර ගැටලු විසදා ගැනීම බුදු සමය අනුමත කරයි.

ගැටලුවලින් තොර සමාජයක් සොයා ගත නොහැක බුදුන්වහන්සේ පහළ වූ සමාජයේ ද නොයෙක් ගැටලුවලින් යුක්ත විය. වර්තමාන සංකීර්ණ සමාජය තුළ ද දිනෙන් දින සමාජ ගැටලු වර්ධනය වෙමින් පවතී. බුදු දහම තුළ සමාජ ගැටලු පිළිබඳව හා එම ගැටලු නිරාකරණය කර ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම ද විග්‍රහ කර දක්වා ඇති බව පැහැදිලි ය. සක්කපඤ්හ, මධුපිණ්ඩික, කලහවිවාද ආදී සූත්‍රවල ගැටුම් ඇතිවීමේ මූලික මනෝමය සාධක ලෙස ප්‍රපංචකරණය ගෙනහැර දක්වයි. පුද්ගලයා පංච ඉන්ද්‍රයන් මඟින් සුබ, දුක්ඛ



උපෙක්ඛා වශයෙන් අරමුණු ග්‍රහණය කර ගනියි. එය සංඥා නම් වේ. සංඥා, තණ්හා, දිට්ඨි, මාන වශයෙන් ඉදිරියට දිවෙන මෙම ක්‍රියාවලිය තව දුරටත් පුද්ගල සන්තානය තුළ වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජයේ විවිධ ගැටුම් නිර්මාණය වන ආකාරය බුදු සමය පෙන්වා දෙයි. බුදුන් වහන්සේ සමාජ ගැටලුවලට ප්‍රධානම හේතුව ලෙස පුද්ගල සන්තානයේ ඇතිවන මෙම නොසන්සුන්කාරී තත්වයන් නිසා සිදුවන බව දේශනා කළහ. සමාජ මානව විද්‍යාවට හා බුදුදහමට අනුව සමාජ ගැටලු ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදිය හැකිය.

- පුද්ගලයා තුළ ඇතිවන ගැටලු
- පුද්ගලයා හා සමාජය අතර ඇතිවන ගැටලු
- සමාජය තුළ ඇතිවන ගැටලු[21]

පුද්ගල සන්තානයේ නොසංසුන් කාරී තත්වය නිසා ඇතිවන ගැටලු පුද්ගලයා තුළ ඇතිවන ගැටලු වන අතර පුද්ගලයාට සාපේක්ෂව බාහිර සමාජය සමග ඇතිවන ගැටුම් නිසා පුද්ගලයා හා සමාජය අතර ගැටුම් නිර්මාණය වෙයි. පුද්ගලයාගේ ක්‍රියාකාරිත්වය හා සමාජ සංස්ථාවන්ගේ අකාර්යක්ෂමතාවය නිසා ඇතිවන ගැටලු සමාජය තුළ ඇතිවන ගැටලු ලෙස විග්‍රහ කළ හැක ඉදිරිපත් කරමින් එම ගැටලු විසදා ගැනීමට අවශ්‍ය පදනම පැහැදිලි කළහ. ඒ අනුව අවුල් වියවුල්වලින් පිරි සමාජයේ එම අවුල්වලින් මිදීමට ශීලයෙහි පිහිටා සමාධිය හා ප්‍රඥාව වර්ධනය කර ගත යුතු බව බුදුන්වහන්සේ අවධාරණය කළහ.

"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො - චිත්තං පඤ්ඤං චභාවයං
ආතාපි නිපකො භික්ඛු - සො ඉමං විජටයෙ ජටන්ති"[22]

"ප්‍රතිසන්ධි ප්‍රඥා ඇති කෙලෙස් තවන වීර්ය ඇති පරිහාරිය නුවණ ඇති (සසර) බිය දක්නා සුලු ඒ සත්ත්ව තෙමේ ශීලයෙහි පිහිටා සමාධිය හා ප්‍රඥාව ද වඩමින් මේ තෘෂ්ණා අවුල නිරවුල් කරන්නේය."

සමාජ ගැටලු කුමන ආකාරයකට විග්‍රහ කළ ද එහි අවසාන විග්‍රහයේ දී පැහැදිලි වන්නේ සමාජය තුළ සියලු ම ගැටලු නිර්මාණය වන්නේ පුද්ගලයා මූලික කරගෙන බවයි. පුද්ගල සන්තානයේ අසහනය තුළ ගැටලු නිර්මාණය වන ආකාරය මජ්ඣිම නිකායේ මහා දුක්ඛක්කන්ද සූත්‍රයේ බුදුන්වහන්සේ දේශනා කළහ. එයින් සන්තාන ගතව ඇතිවන ගැටලු නිවාරණය කර ගැනීමේ

හැකියාව ද පුද්ගලයාට ලැබේ. බුදුන් වහන්සේ ඒ සඳහා සංවර්ධනය කර ගත යුතු ප්‍රධාන අංග තුනක් දේශනා කළ හ. එනම්

- සීලයෙහි පිහිටීම
- සිත සමාධිගත කරගැනීම
- ප්‍රඥාව වර්ධනය කර ගැනීම

මෙයින් සමාජ ගැටලු ඇතිවීමේ හේතු සාධක ඉවත් කිරීම අර්ථවත් වෙයි. ඵලයක් මුලිනුපුටා දමන්නට හේතු සාධක මුලිනුපුටා දැමීම අනිවාර්ය වේ. සියලු ගැටලු නිර්මාණය වන්නේ සංඥාව හා දෘෂ්ටිය දැඩිව ගැනීම නිසාය. පුද්ගල සන්තානයෙන් ආරම්භවන මේ ගැටුම් අවසානයේ පුද්ගලයා තුළ පමණක් නොව පුද්ගලයන් අතර හා සමාජ සංස්ථාවන් තුළ ඇතිවන ගැටලු දක්වා වර්ධනය වෙයි. පුද්ගලයාගෙන් ආරම්භව විකාශනය වන සමාජ ගැටලු නිරාකරණය කර ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රමික ක්‍රියාවලිය ආරම්භ වන්නේ ද පුද්ගලයාගෙන් ය. බුදුන්වහන්සේ විසින් අවුල්වලින් තොර සමාජයක් උදෙසා ඉදිරිපත් කරනු ලබන සීල, සමාධි හා ප්‍රඥා යන ක්‍රමික පිළිවෙත අනෙකක් නොව සත්ත්වයන්ට සසරින් එතර වීම සඳහා දේශනා කළ ආර්ය මාර්ගය ම බව පැහැදිලි වෙයි. බුදුන්වහන්සේ සාමකාමී සමාජයක් උදෙසා අවශ්‍යවන උපදේශ සමූහයක් අරණ විභංග සූත්‍රයේ ඇතුළත් කොට දේශනා කළහ. අන්තගාමී නොවී මධ්‍යම ප්‍රතිපදාව ගැටලු විසඳාගැනීමට ඇති නිවැරදිම මාවත බව එමගින් පැහැදිලි කෙරෙයි.[23]

බුදුදහමට අනුව සමාජය යන්න ගිහි පැවිදි උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසෙන් සමන්විත වෙයි. බෞද්ධ සමාජයක සැමගේ අවසාන පරමාර්ථය වන්නේ ධර්මාවබෝධය කොට සසරින් එතෙරවීමයි. සැබෑ බෞද්ධයා යනු ආර්ය මාර්ගයට පිළිපන් පුද්ගලයාය. ආර්ය මාර්ගයට පිළිපන් පුද්ගලයන්ගෙන් සැදුම් ලත් සමාජය සාමකාමී හා ගැටුම්වලින් තොර අර්ථවත් සමාජයකි. බුදුන්වහන්සේ ආර්ය මාර්ගය පියවර කීපයකින් විවරණය කර දක්වයි.



| | |
|---|---|
| සම්මා දිට්ඨි<br>සම්මා සංකප්ප | ප්‍රඥා |
| සම්මා වාචා<br>සම්මා කම්මන්ත<br>සම්මා ආජීව | සීල |
| සම්මා වායාම<br>සම්මා සති<br>සම්මා සමාධි | සමාධි |

මෙහි සම්මා යනු නිවැරදි දිවිපැවැත්ම යි. නිවනට බාධා කරන පස් පව්, දශ අකුසල් ආදී පාප ධර්මයන්ගෙන් මිදී ජීවත් වීම මින් අර්ථවත් වෙයි. ආර්ය මාර්ගයට පටහැනිව යමෙකු ජීවත් වෙයි නම් එය මිච්චා යනුවෙන් දක්වා ඇත. ඒ අනුව භෞතික වශයෙන් දියුණුවුවත් ආධ්‍යාත්මික වශයෙන් පිරිහීමත් නිසා සමාජ ගැටලු රැසක පැටලී සිටින මිනිසාට එම ගැටළුවලින් මිදීමේ නිවැරදි මාර්ගයක් බෞද්ධ විමුක්ති මාර්ගය තුළ බුදුන්වහන්සේ දේශනා කළහ. බුදු දහම පරිපූර්ණ ඉගැන්වීමක් වශයෙන් ගැටුම්වලින් තොර යහපත් සමාජ සංවර්ධනයක් උදෙසා භෞතික හා ආධ්‍යාත්මික දියුණුව එකට ගමන් කළ යුතු බව අවධාරණය කරන අතර ඒ සඳහා සාමාජීය පුද්ගලයන් අනුගමනය කළ යුතු මාර්ගය ආර්යෂ්ටාංගික මාර්ගය බව පැහැදිලි ය.

සමාජයේ දිනෙන් දින වර්ධනය වන සමාජ ගැටලු සාමාජීය පුද්ගලයන්ගේ ජීවිත අභියෝගයට ලක් කර ඇත. විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවත් සමගම වර්ධනය වී ඇති මේ ගැටලු පිළිබඳව මනෝවිද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක අධ්‍යයනයන් කර එම අර්බුධ විසඳීමේ ක්‍රම න්‍යායන් ඉදිරිපත් කළ ද ඒවාට පරිපූර්ණ විසඳුම් සොයා ගැනීමට නොහැකි වී ඇත. මෙනිසා වත්මන් සමාජය පසුගාමී විෂම සමාජයක් දක්වා වර්ධනය වෙමින් පවතී. සමාජය, අර්බුධවලින් තොරව මිනිසාට ජීවත් වීමට සුදුසු තැනක් විය යුතුය. බුදුන් වහන්සේ මංගල සූත්‍රයේ දී ''පතිරූප දේස වා සෝච'' සුදුසු ප්‍රදේශයක වාසය කිරීමට ලැබීම උතුම් මංගල කරුණක් බව දේශනා කරයි. එනිසා ම බුදුසමය සමාජ ගැටලු පුළුල් දෘෂ්ටි කෝණයකින් බලා ඒවා ඇති වීමට හේතු විග්‍රහ කරන අතර ම ගැටුම්වලින් තොර සාමකාමී සමාජයක් නිර්මාණය කර ගැනීමේ ඇති වැදගත් කම අවධාරණය කරමින් සීල,

සමාධි හා ප්‍රඥා යන ක්‍රමික ක්‍රියාවලිය ගෙන හැර දක්වයි. බුදුන්ගේ එම දේශනය වත්මන් සමාජ ගැටලු නිරාකරණය කර ගැනීමට ඇති සර්ව කාලීන හා සර්ව භෞමික අගයකින් යුත් දේශනයක් බව පැහැදිලි වෙයි.

## ආන්තික සටහන්

1 සංයුත්ත නිකාය 1, **ජටා සූත්‍රය**, 294 පිටුව, බු. ජ. ත්‍රි

2 විමලජොති හිමි විල්ඹයේ, මාවතගම පේමානන්ද හිමි, උඩුහාවර ආනන්ද හිමි (සං) **විද්‍යාසුදනී** (ලන්ඩන් බෞද්ධ විහාරය 2003) 244-245 පිට.

3 දීඝනිකාය 3, **චක්කවත්ති සිහනාද සූත්‍රය**, 116 පිටුව, 1962. බු. ජ. ත්‍රි.

4 දීඝනිකාය 3, **අග්ගඤ්ඤ සූත්‍රය**, 148-155 පිටු, 1976, බු. ජ. ත්‍රි

5 අංගුත්තර නිකාය 4, **ඉණ සූත්‍රය**, 118 පිටුව, 1970, බු. ජ. ත්‍රි

6 මජ්ඣිම නිකාය 2, **රට්ඨපාල සූත්‍රය** (පණ්ඩිත කොදාගොඩ ඤානාලෝක හිමි) 446-447 පිටු, 1973, බු. ජ. ත්‍රි

7 සිරි ඤාණෝභාස තිස්ස මොරගල්ලේ, **විමර්ශන සහිත ධම්මපදය** (කොළඹ : සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම 2004) 389 පිට

8 අංගුත්තර නිකාය 4, **ඉණ සූත්‍රය** , 118 පිටුව, 1970, බු. ජ. ත්‍රි

9 හෙට්ටි ආරච්චි ධර්මසේන, **මුල් බුදු සමයෙන් හෙළිවන බෞද්ධ ආර්ථික දර්ශනය** (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 1994) 203 පිට

10 අංගුත්තර නිකාය 2, **අණන සූත්‍රය**, 130 පිටුව , බු. ජ. ත්‍රි

11 අංගුත්තර නිකාය 5, **ව්‍යග්ඝපජ්ජ සූත්‍රය**, 236 පිට, බු. ජ. ත්‍රි

12 දීඝනිකාය 1, **චක්කවත්ති සීහනාද සූත්‍රය**, 114 පිට, බු. ජ. ත්‍රි

13 දීඝනිකාය , **සිගාලෝවාද සූත්‍රය**, 302 පිට, බු. ජ. ත්‍රි

14 දීඝනිකාය , **මහානිදාන සූත්‍රය**, 86 පිට, බු. ජ. ත්‍රි

15 වාචිස්සර හිමි දෙවින්දර, **මහා පිරිත් පොත** ( කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම 2006) 30 පිට

16 සංයුත්ත නිකාය , **ප්‍රථම සංගීති සූත්‍රය**, 158 පිට, බු. ජ. ත්‍රි

17 දීඝනිකාය 1, **සාමඤ්ඤපල සූත්‍රය**, 110 පිට, බු. ජ. ත්‍රි

18 වාචිස්සර හිමි දෙවින්දර, **මහා පිරිත් පොත** ( කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම 2006) 197 පිට

19 සංයුත්ත නිකාය 1, **කොසල සංයුත්තය**, 158 පිටුව, බු. ජ. ත්‍රි

20 සිරි ඤාණෝභාස තිස්ස මොරගල්ලේ, **විමර්ශන සහිත ධම්මපදය** (කොළඹ : සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම 2004) 389 පිට

21 විමලජොති හිමි විල්ඹයේ, මාවතගම පේමානන්ද හිමි, උඩුහාවර ආනන්ද හිමි (සං) **විද්‍යාසුදනී** (ලන්ඩන් බෞද්ධ විහාරය 2003) 254 පිට

22 මජ්ඣිම නිකාය(මූල පන්නාසක), **මහාදුක්ඛකන්ද සූත්‍රය**, 200 පිට, බු. ජ. ත්‍රි

23 මජ්ඣිම නිකාය(උපරි පන්නාසක), **අරණ විභංග සූත්‍රය**, 448 පිට, බු. ජ. ත